artitle 11

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2023-01-09 |

පැමිණිලිකරු :- පී.එස්.මිල්රෝයි ප්‍රනාන්දු මයා,
122 සි,කෙලින් ජාඩිය ,
වෙන්නප්පුව.

වගඋත්තරකරුවන් :-

01 පො.සැ. 21837 ආර්.එස්.ගුණරත්න මයා,
පොලිස් ස්ථානය,
මාරවිල.

02 පො.කො.41425 එච්.ඒ.ජේ.ප්‍රනාන්දු මයා.
කණිෂ්ඨ නිලධාරින්ගේ භෝජනාගාරය,
චෛත්‍ය පාර, කොළඹ 01.

03 පො.කො.63244 සී.එම්.කේ.චන්දන මයා,
පොලිස් සුභසාධන අංශය.
මුස්තාපා ගොඩනැගිල්ල, කොළඹ.

04 පො.කො.41305 ආර්.ඩී.අමරසිරි මයා.
පොලිස් ස්ථානය
මාදම්පේ.

<u>පැමිණිලි අංකය : **HRC/3886/15**</u>

**පැමිණිලිකරුගේ කරුණු ඉදිරිපත් කිරීම :-**

උක්ත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, හලාවත පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගනු ලැබූ තම ඥාතියෙකුට ඇපයක්




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලබාදිම සඳහා පැමිණෙන ලෙසට කරනු ලැබූ දැනුම්දිම මත මාරවිල පොලිස් ස්ථානයට 2015.10.20 වන දින රාත්‍රි 7.30ට පමණ ගිය අවස්ථාවේදි හලාවත පොලිසියට සම්බන්ධ නිලධාරින් පිරිසක් විසින් සොරකමක් හා සම්බන්ධ බව පවසමින් තමාව අත්අඩංගුවට ගත් බවයි. පසුව ඇඳකට තබා මාංචු දමා පසු දින ඇස් බැඳ වත්තකට රැගෙන ගොස් බිම දිගා කරවා යටිපතුල් වලට පහර දුන් බවත්, මෙම පහරදිම සිදුකරනු ලැබුවේ දූන්කන්නාව වත්තට රැගෙන ගොස් බවත්, එම වත්තෙදි අත්විලංගු දමා උඩුබැලි අතට බිම නිදිකර ඇල්බිසියා කෝටු 15ක් 16ක් පමණ ප්‍රමාණයක් කැඩෙන තෙක් යටිපතුල් වලට පහරදිම් කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇති අතර, 02 වන හා 04 වන වගඋත්තරකරුවන් පහරදුන් බව දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්විම :-**

පැමිණිලිකරු කොමිෂන් සභාව ඉදිරියේ ගොනු කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් ප්‍රකාශකර සිටිනු ලබන්නේ, අදාළ පැමිණිලිකරු පෙර වැරදි සහිත අයෙකු බවත් මාරවිල පොලිස් බල ප්‍රදේශයේ සිදු කරනු ලැබූ සොරකම් සම්බන්ධව සැක පිට 2015.10.20 වන දින පැය 14.40 ට ස්ථානයට භාරදීමෙන් අනතුරුව එදිනම පැය 17.50ට ඇප ලබාදි තිබෙන බවත්ය. මේ සම්බන්ධව මාරවිල මහාධිකරණය වෙත ඒ.ආර්./1289/15 යටතේ කරුණු වාර්තා කර ඇති බවත් පහර දිමක් සිදු නොවූ බවත් සඳහන් කර නැත.

**විමර්ශනයේදි අනාවරණය වි ඇති කරුණු :-**

පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින පරිදි 2015.10.20 දින මාරවිල පොලිස් ස්ථානයට අනුයුක්ත විශේෂ ඒකකයේ නිලධාරින් මහින් අත්අඩංගුවට ගැනීමක් සිදුව ඇති අතර, දිගින් දිගටම පොලිස් බල ප්‍රදේශයේ සිදුවන ගෙවල් බිඳුම් හා ඒවායේ ස්වභාවය කාලයක් තිස්සේ නිරික්ෂණය කර විමර්ශයකින් පසුව අත්අඩංගුවට ගත් බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත.මෙහිදි විමසීමට ලක් විය යුතු ගැටලුව වන්නේ අත්අඩංගුවට ගැනීම හා සොරකම් පිළිබඳ විමර්ශනය කිරීම නොව අත්අඩංගුවට ගැනීමෙන් පසුව පහරදීමකට හෝ කෲර අවමන් සහගත සැළකිල්ලකට ලක් කළේද යන්න වේ. පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර සිටිනු ලබන්නේ, අත්අඩංගුවට ගත් දිනට පසු දින ඇස්බැඳ පොල්වත්තක් වෙත රැගෙන ගොස් බිම දිගාකර යටිපතුල් වලට පහරදිම් කළ බවයි.

මෙම පහරදිම් සම්බන්ධව ඇති වූ තුවාල හා ආසාත්මිකතාවය සම්බන්ධයෙන් ද පැමිණිලිකරු 2015.10.22 සිට කුලියාපිටිය මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගෙන ඇත. එහිදි අධිකරණ වෛද්‍ය පරීක්ෂාවකට ද ලක් කර ඇති අතර, වෛද්‍ය වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් වෛද්‍ය මහින්ද මල්වත්ත මහතා ප්‍රකාශ කර ඇත්තේ, 'රොගියාගේ දකුණු කකුලේ යටිපතුල් ප්‍රදේශයේ අස්ථි බිඳුමක් තිබෙන බවත්

එය බරපතල තුවාලයක් බවත්ය .තවද රෝගියාගේ රෝග ඉතිහාසය හා තුවාලය එකිනෙකට ගැලපෙන බවද' ප්‍රකාශ කර ඇත.

ඒ අනුව සමස්ථයක් ලෙස බැලීමේදී පැමිණිලිකරුගේ පැමිණිල්ලෙන් පහරදුන් බව හා පහරදීම් කළ ආකාරය දක්වා ඇත. එම තුවාල සහ වෛද්‍ය වාර්තා ගැලපීමක් සිදුවන අතර, එම පහරදීම සිදු කළ ආකාරය 2017.06.06 දින පැවති පරීක්ෂණයේදී අගතියට පත් තැනැත්තා විසින් ප්‍රකාශ කර ඇත. එහිදී අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව දුන්කන්නාව වත්තට රැගෙන ගොස් අත් විලංගු දමා උඩුබැලි අතට බිම නිදි කරවා ඇල්බිසියා කෝටු 33 ක් රැගෙන විත් ඉන් 15 ක 16 ප්‍රමාණයක් කැඩෙන තෙක් යටිපතුල් වලට දරුණු ලෙස පහර දුන් බව ප්‍රකාශ කර ඇත. එහිදී වගඋත්තර පාර්ශවයන්ගේ නම් දෙකක් සඳහන් කළද, ඒ පිළිබඳ වැඩිදුර කරුණු තහවුරු වීමක් සිදුවී නොමැත. නමුත් පහරදීමක් සිදුවූ බවට කරුණු නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මෙකී කරුණු අනුව පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටින පරිදි උක්ත වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, වගඋත්තර පාර්ශවයන් සම්බන්ධව පරික්ෂණයක් කර විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති වෙත යොමු කරනු ලැබේ.

2023. 02 . 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධව කොමිෂන් සභාව වෙත වාර්තාවක් ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති වෙත දන්වමු.

එසේම, මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

1. අමාත්‍යතුමා,
   මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
   14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

2. පොලිස්පති,
   පොලිස් මූලස්ථානය,
   කොළඹ 01.

3. ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරි,
   ප්‍රාදේශීය කාර්යාලය,
   මානව හිමිකම් කොමිෂන් සභාව, අනුරාධපුර,

ස/b